**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව**

**කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බහුකාර්ය බණ්ඩ 1 සේවා ගණය (MN-2) සඳහා**

**II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2022**

කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බහුකාර්ය බණ්ඩ 1 සේවා ගණය (MN-2) නිලධාරින් සඳහා II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල් විසින් **2022 දෙසැම්බර්** මාසයේ දී කොළඹ දී සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් පැවැත්වීමට සැලසුම් කර ඇත.

**1. විභාග පරිපාටිය**

1.1. II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය දෙපාර්තමේන්තුගත සියළුම කළමනාකරණ සහකාර නිලධාරින්

1.1.1. විභාගය පිළිබඳ විස්තරය:

| ප්‍රශ්න පත්‍රය | කාලය | උපරිම ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ආයතන සංග්‍රහය | පැය 01 | 100 | 40 |
| මුදල් රෙගුලාසි | පැය 01 | 100 | 40 |

1.1.2. විභාගය සඳහා වන විෂය නිර්දේශය:

| විෂයයන් | විෂය නිර්දේශය | කාලය |
|---|---|---|
| ආයතන සංග්‍රහය | <u>රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, ආයතන සංග්‍රහයේ විධිවිධාන</u><br><br>ආයතන සංග්‍රහයේ I,II, III, IV, VII, VIII, XII, XIII, XIV, XIX, XXIV, XLVII සහ XLVIII පරිච්ඡේද ආශ්‍රයෙන් හා 2009.02.20 දිනැති ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩය ආශ්‍රයෙන් | පැය 01 |
| මුදල් රෙගුලාසි | <u>මුදල් රෙගුලාසි</u><br><br>ගණන් දීමේ නිලධාරි - මු.රෙ. 124, 125, 127, 128 සහ 135<br>රාජ්‍ය මුදල් ලැබීම් - මු.රෙ. iv පරිච්ඡේදය<br>ආණ්ඩුවේ මුදල් යනාදියේ ආරක්ෂාව - මු.රෙ. vi පරිච්ඡේදය | පැය 01 |

2. අයදුම්පත් ඉදිරිපත් කිරීම:

මෙම පරීක්ෂණයට පෙනී සිටීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින් මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුකූලව A4 කඩදාසියක දෙපැත්තම පාවිච්චි කරමින් අංක 01 සිට 05 දක්වා ඡේද එක් පිටුවකටත්, ඉතිරි කොටස අනෙක් පිටුවටත් වන සේ සකසා ගත් අයදුම්පත් අධීක්ෂණ නිලධාරියාගේ නිර්දේශය සහිතන **2022.11.18 දින හෝ ඊට ප්‍රථම සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල්** වෙත ලැබෙන සේ එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ **"කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බහුකාර්ය බණ්ඩ 1 සේවා ගණය (MN-2) සඳහා II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය-2022"** යනුවෙන් සඳහන් කළ යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. විභාගයට පෙනී සිටීමට සුදුසුකම්:

මෙම නිවේදනය සැලකිල්ලෙන් කියවා ඉල්ලා ඇති සියලුම තොරතුරු සම්පූර්ණ කර, අයදුම්පත් දිනට හෝ ඊට පෙර ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. මෙම නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවය අයදුම්පත් වෙතොත් ඒවා ප්‍රතික්ෂේප කිරීමට සිදුවනු ඇත.

4. විභාගයට ඇතුළත් කර ගැනීම හා ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම:

අයදුම්පත් ඉදිරිපත් කර ඇති සුදුසුකම් සපුරා තිබෙන සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර හා කාලසටහන් විභාග කමිටුව විසින් නිකුත් කරනු ලැබේ.

5. විභාගයට පෙනී සිටීම සඳහා පැමිණීම වෙනුවෙන් ගමන් වියදම්, සංයුක්ත දීමනා හෝ උපවේශන දීමනා කිසිවක් ගෙවනු නොලැබේ.

ආර්.ඩී.පී. වෙඩික්කාර
අධ්‍යක්ෂ (පාලන) වැ.බ.
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට